# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**2016 පෙබරවාරි මස 19 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2016.02.23 දින නිකුත් කරන ලදී)**


## මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. එස්. තවුෆික් මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 තැපැල් ගාස්තුව : රු. 10.00

# මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ)

## මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය " යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන විද්‍යාලයක්, එහි සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එහි පරමාර්ථ සඵලාත්මකව මුදුන් පමුණුවා ගැනීම සහ එකී මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලයට සම්බන්ධ සියලු කරුණු ඉටුකර ගෙන යාම සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ මුතූර් හි පිහිටුවා තිබූ හෙයින් ද :

එකී ආයතනය පිහිටුවීමට මුල් වූ පරමාර්ථ සහ කාරණා එකී ආයතනය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද :

එකී මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය සංස්ථාගත කරන ලෙස එකී විද්‍යාලයේ පාලන සභාව විසින් ඉල්ලුම්කර ඇති හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක    දරන මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන් පසු (මෙහි මින්මතු "විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලයේ කටයුතු මෙතෙක් කල් කළමනාකරණය කල සහ ඉටුකළ තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ පරිපාලන සභාවට මේ පනතේ විධිවිධානවලට සහ මේ පනත යටතේ සාදන ලද රීතිවලට අනුකූලව මින්මතු අතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන) "මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණයන් හි නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ අයිතිය ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවාගනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාවේ සිටින මුස්ලිම්වරුන්ගේ ආගමික, අධ්‍යාපනික සමාජ, සංස්කෘතික අභිවෘද්ධිය ප්‍රවර්ධනය කිරීම ;

(ආ) අරාබි භාෂා පිළිබඳ පුළුල් දැනුමක්, අවබෝධයක්, හැකියාවක් ශිෂ්‍යයිනට ලබාගැනීමට හැකිවන අයුරින් අරාබි භාෂාව, එහි ව්‍යාකරණ, සාහිත්‍ය, ගද්‍ය සහ පද්‍ය හා ඒ හා සමාන තවත් විෂයයන් ඉගැන්වීම දිරිමත් කිරීම ;

(ඇ) පික්හ්, තෆසීර්, හදීස්, ආදීන්ට අනුකූලව ෂරීඅත් නොහොත් ඉස්ලාමීය නීති ශාස්ත්‍රය ද, අරාබි භාෂාවෙන් ඇති ඊට සමාන තවත් විෂයයන්ද ඉගැන්වීම ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) ශුද්ධ වූ කුරාණය තජ්විද් ක්‍රමයට අනුව කියවීම සහ අල් කුරාණය කටපාඩමින් කියවීම නොහොත් හිෆ්ලුල් කුර්ආන් ආදීන් ඉගැන්වීමට සහයෝගය දී දිරිගැන්වීම ;

(ඉ) ඉහත අ, ආ,ඇ,ඈ වගන්තිවල සඳහන් කරුණුවලින් එකක් හෝ කිහිපයක මනා දැනුමක් ලබාගැනීමට සිසුනට හැකිවන ආකාරයෙන් අරාබි භාෂාවෙන් ඇති සමාන විෂයයන් ඉගැන්වීම දිරිගැන්වීම ; සහ

(ඊ) ඉහත කී පරමාර්ථ සියල්ල හෝ එයින් කුමක් හෝ සාක්ෂාත් කිරීමේ අරමුණින් හෝ එසේ සාක්ෂාත් කිරීමට උචිත වන සියලුම කටයුතු සහ මෙම පනතට එකඟ තවත් කටයුතු හා කාර්යයන් කිරීම,

තව ද, මෙම කොටස් සඳහන් කරනු ලබන සියලුම කරුණු විශේෂයෙන් සුන්නත් අල් ජමාන්වලට අනුකූලව පමණක් විද්‍යාලයේ උගන්වනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටුකිරීමට හෝ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර හෝ උචිත සියලු කටයුතු, කාරණා හා දෙවල් කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය. මේ අනුව බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වසා දැමීම ද, ඇපකරුවන් සහිතව හෝ ඇපකරයක් රහිතව ණය ලබා ගැනීමේ සහ අරමුදල් එකතු කිරීමේ ද, සංස්ථාවට අයත් අරමුදල් ආයෝජනය කිරීමට ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයෙහි යෙදවීමේ, සේවයේ නියුක්ත කරවීමේ හා සේවයෙන් ඉවත් කිරීමේ ද බලය සංස්ථාවේ ඇත්තේ ය:—

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන එවැනි සාමාජිකයින්ගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් මගින් කළමනාකරණය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී විද්‍යාලයේ පරිපාලන සභාවේ සාමාජිකත්වය දැරුවා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කළ සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එවැනි රීති සාදනු ලැබීමෙන් පසු එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරතුවම වූ දිනයේ දී විද්‍යාලයෙහි බලපැවත්වූ රීති මේ වගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තා හ.

විද්‍යාලය විසින් ගෙවිය යුතු සහ විද්‍යාලයට අයවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විද්‍යාලයේ පැවැති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින්, ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට විද්‍යාලයට අයවිය යුතු සියලුම ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හා ආධාර මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.

**8.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත සතුවන යම් චංචල හෝ නිශ්චල දේපලක් භාරගැනීමේ සහ දැරීමේ සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් කළහැකි අතර, ඒ සඳහා සංස්ථාවට නීතියෙන් බලය ඇත්තේ ය. තව ද, එවැනි දේපල මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව ඒ දේපල උකස් කිරීම, විකිණීම, බද්දට දීම හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

**9.** සංස්ථාවේ මුදල් සහ දේපල කවර ස්ථානයකින් උද්ගත වූව ද මෙහි දක්වා ඇති පරිදි හුදෙක්ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ කරගත යුතු අතර, ඉන් කිසිම පංගුවක්, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක ආකාරයෙන් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය — සංස්ථාවේ අරමුදල.

(අ) සංස්ථාව වෙනුවෙන් කරනු ලබන යම්කිසි සේවාවක් සඳහා සංස්ථාවේ කවර හෝ නිලධාරියකුට හෝ සේවකයකුට හෝ සංස්ථාවේ සාමාජිකයකුට සාධාරණ හෝ සුදුසු වේතනයක් යහපත් අයුරින් ගෙවීම ද ;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයෙක් කොටස්කරුවකු වී සිටින සමාගමක් මගින් සංස්ථාව වෙනුවෙන් කුලියට දී ඇති කිසියම් දේපලක් සඳහා සාධාරණ මෙන්ම සුදුසු කුලිය ගෙවීම ද;

(ඇ) සංස්ථාවේ කවර හෝ සාමාජිකයකු, නිලධාරියකු හෝ සේවකයකු විසින් ඔහුගේ කර්තව්‍ය හෝ යුතුකම් ඉටුකිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී හෝ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා පාලක සභාවේ පූර්ව අනුමැතිය මත කරනු ලබන සාධාරණ සහ සුදුසු වියදම් නැවත පියවීමට බාධා කරනු නොලැබේ.

**10.** පහත සඳහන් දේ සහ කාරණා ඉටු කිරීමේ බලතල සංස්ථාවට ඇත්තේ ය:— සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමට උචිත බවට සලකනු ලබන මෙන්ම සංස්ථාවේ පරමාර්ථවල අවශ්‍ය සංස්ථාවේ වන සහ එකී පරමාර්ථ සඳහා නීත්‍යානුකූලව පවරාගැනීමට හැකිවන ඉඩම් හෝ ගොඩනැගිලි මිළට ගැනීම ;

(ආ) සංස්ථාවේ අවශ්‍යතාවයන් සඳහා දැනටමත් අත්‍යවශ්‍ය නොවන අරමුදල් පාලක සභාව විසින් සුදුසුයයි නිගමනය කරනු ලබන එවැනි අරමුදල් ආයෝජනය කිරීම හෝ හුවමාරු කිරීම ;

(ඇ) සංස්ථාවේ කිසියම් පරමාර්ථයක් උදෙසා අරමුදල් එකතු කිරීම හෝ ණය වශයෙන් ලබා ගැනීම, කළමනාකාර කමිටුව මගින් උචිත යයි සලකනු ලැබිය හැකි එවැනිම ආකාරයේ සංස්ථාවේ යම්කිසි ණයක් හෝ පැවරීමක් වගකීම් බැහැර කිරීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා ත්‍යාග මුදල්, ග්‍රාහක මුදල්, පැවරීම්, පරිත්‍යාග, ගාස්තු ආදිය දේශීය වශයෙන් හෝ විදේශීය වශයෙන් ඉල්ලීම, එකතු කිරීම සහ ලබා ගැනීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය කිසියම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හුවමාරු කිරීම හෝ පරිපාලනය කිරීම ;

(ඊ) සංස්ථාව මගින් කලින් කළ තීරණය කරගන්නා අයුරින් නිලධාරින් හා සේවකයන් බඳවා ගැනීම, සේවයෙන් අස්කිරීම හෝ සේවයෙන් නෙරපීම සහ එවැනි වේතන සහ පඩිනඩි ඔවුනට ලබාදීම ;

(උ) සංස්ථාවේ පරමාර්ථයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කිසියම් පුද්ගලයකු සමග හෝ සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාත කරනු නොලැබූ හෝ කිසියම් සමාගමක් සමග හෝ පුද්ගලයින් පිරිසක් සමග හෝ රාජ්‍ය දෙපාර්තමේන්තුවක් සමග හෝ පළාත් පාලන ආයතනයක් සමග හෝ යමක් ඇතිකර ගැනීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ සුදුසු අයුරින් සාක්ෂාත් කිරීමටත්, ඉටුකිරීමටත් අත්‍යවශ්‍ය වන හෝ උචිත වන මෙම පනතට හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන සියලුම දේ කිරීම සහ ඉටුකිරීම.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිඳු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතුය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මගින් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය ආයතනයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.